# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2182/22 - 2020 ජුනි මස 30 වැනි අඟහරුවාදා - 2020.06.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

14 වැනි වගන්තිය යටතේ නියෝගය

කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 (2) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති භාණ්ඩයට අනුරූපව 2017 නොවැම්බර් මස 27 දිනැති අංක 2047/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද, 2020 ජුනි මස 3 දිනැති අංක 2178/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් සංශෝධිත නියමයෙහි උපලේඛනයෙහි IV වැනි තීරුවෙහි දක්වා ඇති සෙස් බදු ප්‍රමාණය 2020 ජූලි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන ලෙස අවලංගු කරනු ලබන බව ප්‍රකාශ කරමි.

ප්‍රසන්න රණතුංග,
කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2020 ජුනි මස 30 වැනි දින,
කොළඹ 01,
කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

| *සං.ව. ශීර්ෂය (I)* | *සංයෝජිත වර්ගීකරණ සංකේතය (II)* | | *විස්තරය (III)* | *සෙස් බදු ප්‍රමාණය (IV)* |
|---|---|---|---|---|
| 25.23 | | | වර්ණ ගැන්වූ හෝ නොගැන්වූ කැට වශයෙන් වූ හෝ එසේ නොවූ පෝට්ලන්ඩ් සිමෙන්ති, ඇලුමිනියම් මිශ්‍රිත සිමෙන්ති (සිමෙන්ති පොණ්ඩු), යාබොර සිමෙන්ති, සුපර් සල්පේට් සිමෙන්ති සහ එවැනි හයිඩ්‍රොලික් සිමෙන්ති වර්ග | |
| | 2523.10 | - | සිමෙන්ති කැට (ක්ලින්කර්) | කි. ග්‍රෑමයකට රු. 1.00 |

08 - 75

1A - PG 5065 — 567 (2020/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*